# සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලිය 2023

## භාෂා භාවිතය හා අවබෝධය

## පාසල් මට්ටම

7 ශ්‍රේණිය කාලය පැය එකයි

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් පදවලට සමානාර්ථ පද ලියන්න.

i. ග්‍රන්ථය - ................................
ii. ප්‍රවෘත්තිය - ............................
iii. ප්‍රසාදය - ................................
iv. මුහුණ -...................................
v. අවසානය - ...........................
vi. කැලය - ................................
vii. ඇතා - ..................................
viii. අන්ධකාරය - .........................
ix. චංචල -.................................
x. ප්‍රාකාර -................................

(02) 'අ' තීරුවට ගැළපෙන අදහස 'ආ' තෝරා යාකරන්න.

| අ | ආ |
|---|---|
| i. කිඹුල් කඳුළු හෙළීම | සතුටින් හා අපේක්ෂාවෙන් සිටීම |
| ii. කුකුළා අතින් අරන් | වැරදි අවබෝධයකින් සිටීම |
| iii. බක තපස් රැකීම | බොරු සෙනෙහසක් පෙන්වීම |
| iv. කරල පැහුණා | බලය පිරිහී |
| v. තරු පෙනුණා | ස්වල්ප වේලාවක නින්ද |
| vi. අමු කැවිලා | වාසියක් සිදුවීම |
| vii. අන්තිම ඉත්තත් ඇදීම | උදෑසනින් ම |
| viii. පොරකටු ගෙවිලා | අනපේක්ෂිත ගැටලුවකට මුහුණ දීම |
| ix. ඇඟිලි ගනිමින් සිටියා | බොරු කියමින් මවා පෑම |
| x. කුකුළු නින්ද | අවසාන උත්සාහයත් ගැනීම |

(03) පහත සඳහන් පදවල හිස් තැනට යෙදිය යුතු අක්ෂරය වරහන් තුළින් තෝරා ලියන්න.

i. මර්....නය (ද/ධ)
ii. ප්‍රශ්.... (න/ණ)
iii. ප්‍රති....ල (ප/ඵ)
iv. ලේ....ම් (ක/ඛ)
v. උච්....රණ (චා/ඡා)
vi. පා....ශාලාව (ට/ඨ)
vii. තම්බප....ණි (න්/ණ්)
viii. ....න්ගතු (ලෙ/ළෙ)
ix. පිළිවෙ.... (ල/ළ)
x. ශිෂ්....චාරය (ටා/ඨා)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාව බතින් බුලතින් පෝෂණය කිරීමට අධිෂ්ඨාන කරගත් පාලකයෙක් පස් වන සිය වසේ දී කලා වැව හා බලලු වැව් යුගල එක් කර විශාල ජලාශයක් ඉදි කළේ ය. ඒ ධාතුසේන රජු ය. මෙසේ විශාල ජලාශයක් කළ රජතුමා එම ජලය අඩි 40 ක් පමණ පළල යෝධ ඇළ ඔස්සේ සැතපුම් 54 ක් දුර ඇති අනුරාධපුරයට ගෙන ගියේ ය. සියවස් දහසයකට පෙර එබඳු මහා පරිමාණයේ ඇළක් එවන් භූමි භාගයක නිර්මාණය කළේ කෙසේ ද? යන්න විමතියට කරුණකි. පළමු සැතපුම් දාහතේ දී එය සෙමෙන් ඇදී යන්නේ සැතපුමට අඟල් හයක් පමණ බෑවුමක් ඇති ව ය.

i. ධාතුසේන රජතුමා මෙරට පාලකයා වූයේ කිනම් සිය වසේ ද

ii. ධාතුසේන රජතුමා ශ්‍රී ලංකාව බතින් බුලතින් පෝෂණය කිරීමේ අරමුණින් කළ කාර්යය කුමක් ද?

iii. විශාල ජලාශයෙහි ජලය අනුරාධපුරයට ගෙන ගියේ කෙසේ ද?

iv. පළමු සැතපුම් දාහතේ දී යෝධ ඇළේ බෑස්ම කොපමණ ද?

v. මෙම ඡේදයට අනුව යෝධ ඇළ සම්බන්ධ ව සිංහලයාගේ කෙබඳු දස්කමක් හෙළි වේ ද?

(05) පහත වාක්‍යවල හිස් තැනට ගැළපෙන උක්ත පදය හෝ අනුක්ත පදය ලියන්න.

i. දෙමව්පියෝ ................................. යහමග යවති.

ii. ....................... රෝගීන් සුවපත් කරති.

iii. හෙදිය රෝගීන්ට ..................... ලබා දෙයි.

iv. ......................... අහසේ පියාසර කරති.

v. ......................... කුඹුර කොටයි.

vi. ......................... පුටු සාදති.

vii. ......................... පඩම් කරයි.

viii. මාර්ග නීති ....................... නිසි මග යවයි.

ix. ජනාධිපතිතුමා ........................... අමතයි.

x. නිවේදකයෝ ආධුනික ...................... පුහුණු කරති.

- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමිවේ.